සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுமைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development

| මගේ අංකය / எனது இல / My No | DSD/HO/10/IA/CC/පොදු | ඔබේ අංකය / உமது இல / Your No | ........................ | දිනය / திகதி / Date | 2021.04.20 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම් /අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
ප්‍රාදේශීය ලේකම්..........................
සමෘද්ධි කළමණාකරු - සමෘද්ධි බැංකු සමිතිය...................

**<u>ප්‍රාදේශිය විගණන ඒකක (Audit Units) පිහිටුවීම හා නවක සංවර්ධන නිලධාරින් රාජකාරි සඳහා අනුයුක්ත කිරිම</u>**

2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ (2017 අංක 2 දරණ සංශෝධිත සමෘද්ධි පනත) 5(ඊ) වගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම මුදල් රෙගුලාසි 133,134,2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වන වගන්තිය හා කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ නිශ්චිත උපදෙස් අනුව පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය මෙම දෙපාර්තමේන්තුව තුල ස්වාධීන අංශයක් ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

02.සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු වූ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම,දිළිඳුබව තුරන් කිරිම සහ සමාජ සාධාරණත්වය සහතික කිරිමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරිම සඳහා අදාල පනතේ සඳහන් කර්තව්‍ය හා බලතල ප්‍රකාර පුළුල් කාර්යභාරයක් මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරි ඇත.ඒ අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමේ සංවර්ධන කටයුතු ප්‍රමාණාත්මකව ඉහල මට්ටමක පැවතිමත් නිලධාරින් වෙත පැවරි ඇති කාර්යභාරය පුළුල් වීමත් සැලකිල්ලට ගෙන පරිපාලන හා මූල්‍ය කටයුතු විධිමත් කිරිමේ අරමුණින් ප්‍රාදේශිය විගණන ඒකක ස්ථාපිත කිරිමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්තිමය තිරණයක් ගෙන තිබේ.ඒ අනුව දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුල ස්වාධීන ඒකකයක් ලෙස ස්ථාපිත වී ඇති දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය තවදුරටත් ප්‍රාදේශිය මට්ටමේ ස්වාධීන ඒකකයක් ලෙස විමධ්‍යගත වනු ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

03.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ එකක් හෝ කිහිපයක් ඒකාබද්ධ කර සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි විගණන ඒකක (Audit Units) පිහිටු විමට කටයුතු සැළසුම් කර ඇති අතර මේ සමඟ ඉදිරිපත් කරන ඇමුණුම 01 හි සඳහන් සමෘද්ධි බැංකු සමිති කාර්යාලවල විගණන ඒකක ස්ථාපිත කිරිමට නියමිතය.මෙම කාර්යාල සඳහා අවශ්‍ය භෞතික පහසුකම් අනුක්‍රමිකව ලබා දිමටද සැළසුම් කර ඇත.

04.නිලධාරින් අනුයුක්ත කිරිම.

උපාධිධාරි යෝජනා ක්‍රමය යටතේ සංවර්ධන නිලධාරි  තනතුරට බඳවා ගෙන ස්ථිර පත්වීම් ලබා මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද නවක නිලධාරින්ගෙන් තෝරා ගත් පිරිසක් විගණන කටයුතු සඳහා යථෝක්ත විගණන ඒකක වෙත අනුයුක්ත කරන ලදි.එමෙන්ම අභ්‍යන්තර විගණන අංශයේ දැනට සේවය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ද එම ඒකකය වෙත අනුයුක්ත කිරීමට නියමිතය.ඒ අනුව විගණන ඒකකයට අයත් සියලුම කාර්යාල,සමෘද්ධි බැංකු,බැංකු සමිති,ප්‍රජා මූල සංවිධාන,ප්‍රාදේශීය සංවිධාන වල විගණන කාර්යභාරය අදාල නිලධාරීන් වෙත විධිමත්ව පැවරීමට අපේක්ෂිතය.

05.නිලධාරීන්ගේ පරිපාලන කටයුතු

විගණන ඒකකයට අනුයුක්ත විගණන කාර්යය සිදුකරන සියලුම නිලධාරීන්ගේ පැමිණීම,නිවාඩු,බැහැර යාම,වැටුප් සකස් කිරීම වැනි පරිපාලන කටයුතු අතිරේක අධ්‍යක්ෂක ජනරාල්වරයකු ලෙස දිස්ත්‍රික් ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරයා වෙත පැවරෙන අතර විගණන රාජකාරි වලට අදාල අනෙකුත් සියලුම කාර්යයන් ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ පූර්ණ අධීක්ෂණයට යටත් වේ.මෙයට පෙර දිස්ත්‍රික් විගණන ඒකක වලට අනුයුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් ලබා දී ඇති චක්‍රලේඛන  උපදෙස් ඒ ආකාරයෙන් තවදුරටත් වලංගු වන අතර නිලධාරීන් ස්ථානගත කිරීම,රාජකාරි පැවරීම හා අදාල විගණන රාජකාරී සම්බන්ධයෙන් විස්තරාත්මක උපදෙස් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ලබාදෙනු ඇත.

06.විගණන ඒකක වලට අනුයුක්ත කර ඇති විවිධ විෂය ක්ෂේත්‍ර වලට අදාල අනෙකුත් උපාධිධාරි සංවර්ධන නිලධාරින්ගේ පරිපාලන කටයුතු සාමාන්‍ය පරිපාලන ක්‍රමවේදය අනුව සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා ප්‍රාදේශිය ලෙකම්ගේ අධික්ෂණය යටතේ  සිදුකල හැකි අතර ඊට අදාල විස්තරාත්මක උපදෙස් ද ඉදිරියේදි ලබාදෙනු ඇත.

07.මේ පිළිබඳව නවක සංවර්ධන නිලධාරින් සඳහා පැවැත්වෙන පුහුණු වැඩමුළු වලදි තවදුරටත් පැහැදිලි කිරිම් සිදුකරනු ඇත.

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් - 01.ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූලය,ස්වයං රැකියා ව්‍යාපාර,
සංවර්ධන හා රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය කා.දැ.ස

02. අධ්‍යක්ෂ ජනරාල් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව කා.දැ.ස

03. විගණකාධිපති

04.සියළුම අංශ ප්‍රධානින් කා .දැ.ස